# කෘෂිකර්ම අමාත්‍යාංශය
# கமத்தொழில் அமைச்சு
# Ministry of Agriculture

80/5 ,"ගොවිජන මන්දිරය", රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
80/5, "கொவிஜன மந்திரய",ரஜமல்வத்தை ஒழுங்கை,பத்தரமுல்லை, இலங்கை.
80/5 ,"Govijana Mandiraya", Rajamalwatta Lane, Battaramulla, Sri Lanka.


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය.<br>எனது இல.<br>My No. | 4/2/9/8 | ඔබේ අංකය.<br>உமது இல.<br>Your No. | | දිනය.<br>திகதி.<br>Date. | 2022.01. 15 |

පළාත් කෘෂිකර්ම ලේකම් මගින්,
පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන් (බස්නාහිර, මධ්‍යම,දකුණ, උතුර, නැගෙනහිර, වයඹ, උතුරුමැද, ඌව, සබරගමුව)

කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් මගින්,
සියළුම අන්තර් පළාත් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන්

## <u>සෞභාග්‍යා ගෙවතු වගා වැඩසටහන - 2022</u>

ඉහත වැඩසටහන යටතේ ගොවීන් හා තවාන්කරුවන් පුහුණු කිරීමේ කටයුතු කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කිරීමට යෝජිත වේ.

02. මෙහිදී මූලිකව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් හඳුනාගනු ලබන තවාන්කරුවන් වෙත අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දිය යුතු වේ. මේ සඳහා අදාල නාම ලේඛන සකස් කිරීම සහ පුහුණු වැඩසටහන් සංවිධානය සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන අතර අදාල පුහුණු වැඩසටහන් පැවැත්වීම සම්බන්ධයෙන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමග සාකච්ඡා කර දින වකවානු සකස් කර ගත යුතු වේ.

03. එසේම, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් හා අනෙකුත් ග්‍රාමීය මට්ටමේ නිලධාරීන් විසින් හඳුනා ගනු ලබන ගෙවතු වගාකරුවන් පුහුණු කිරීමේ කටයුතු ඔබ විසින් සිදුකළ යුතු වේ. ඒ සඳහා අදාල අංශ සමඟ සාකච්ඡා කර පුහුණු වැඩසටහන් සංවිධානය කරවා ගෙන අවශ්‍ය තාක්ෂණික පුහුණු ලබා දීමට කටයුතු කල යුතු වේ.

04. මෙහිදී තවාන්කරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් 2022 පෙබරවාරි 05-06 දිනයන්හි දී ආරම්භ කිරීමට අපේක්ෂා කරනු ලබන අතර ඔබ යටතේ සේවය කරන අදාල කෘෂිකර්ම උපදේශකවරුන් දැනුවත් කර පුහුණු වැඩසටහන් පැවැත්වීමට අවශ්‍ය පියවර කඩිනමින් ගත යුතු වේ.

05. තවද, මෙම පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ලබාගැනීම සඳහා අදාල මූල්‍ය ඇස්තමේන්තු සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

ඩී. එම්. එල්. බණ්ඩාරනායක
ලේකම්
කෘෂිකර්ම අමාත්‍යාංශය

පිටපත් :

i. ලේකම්, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
ii. ලේකම්, මුදල් අමාත්‍යාංශය
iii. ලේකම්, සමෘද්ධි රාජ්‍ය අමාත්‍යාංශය
iv. පළාත් ප්‍රධාන ලේකම්වරුන්
v. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්
} කාරුණික දැන ගැනීම සඳහා

vi. කොමසාරිස් ජනරාල්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
vii. කොමසාරිස් ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
} පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන් සමඟ සාකච්ඡා කර අදාල පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම පිණිස ඔබ දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන් දැනුවත් කිරීම සඳහා

viii. සියළුම දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන් - පුහුණු වැඩසටහන් සම්බන්ධීකරණය ඇතුළු සෞභාග්‍යා ගෙවතු වගා වැඩසටහනෙහි සියළුම සම්බන්ධීකරණ කටයුතු සඳහා


ලේකම් / செயலாளர் / Secretary — දුරකථන தொலைபேசி Telephone - 011-2034340; ඊ-මේල් மின்னஞ்சல் e- mail - secretary@agrimin.gov.lk; ෆැක්ස් தொலைநகல் Fax - 011-2863497
කාර්යාලය / அலுவலகம் / Office — දුරකථන தொலைபேசி Telephone - 011-2034300; ඊ-මේල් மின்னஞ்சல் e- mail - info@agrimin.gov.lk; ෆැක්ස් தொலைநகல் Fax - 011-2868910